ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# පරීක්ෂක වාර්තාව

අදියර I විභාගය - 2021 ජනවාරි

## (103) ආර්ථික විද්‍යාව

(Economics)

## A කොටස

### ප්‍රශ්න අංක 01

මූලික ආර්ථික විද්‍යාත්මක න්‍යායන් හා සංකල්ප පදනම් කරගෙන විෂය නිර්දේශයට ගැලපෙන ලෙස මෙම කොටස සකස් කර ඇත.

ප්‍රශ්න අංක **1.1** සිට **1.10** දක්වා දෙන ලද වරණයන් තුලින් නිවැරදි පිළිතුර තේරීමත් ප්‍රශ්න අංක **1.11** සිට **1.12** දක්වා ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුර වරහන් තුළ දී ඇති පිළිතුරු අතරින් තේරීමත් ප්‍රශ්න අංක **1.13** සිට **1.15** දක්වා යම් ප්‍රකාශයක් දී එහි සත්‍ය හෝ අසත්‍ය බව දැක්වීමත් ප්‍රශ්න අංක **1.16** සිට **1.20** දක්වා ඇති ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර උත්තර පත්‍රයේ දැක්වීමටත් අවශ්‍යවන පරිදි මෙම ප්‍රශ්නය සකස් කර ඇත.

මෙම පළමු ප්‍රශ්නයට බොහොමයක් අයදුම්කරුවන් සාර්ථක ලෙස පිළිතුරු සපයා තිබුණත් සමහර ප්‍රශ්න සඳහා අයදුම්කරුවන්ගේ පිළිතුරුවල අඩුපාඩු නිරීක්ෂණය විය. ඒ අනුව පොදුවේ දක්නට ලැබුණු දුර්වලතා /වැරදීම් කිහිපයක් පහත පරිදි වේ:

**(1.1)** ආර්ථික භාණ්ඩයක ලක්ෂණයක් ලෙස ආර්ථික සංකල්ප පිළිබඳ අවබෝධය පරීක්ෂා කිරීමට මෙම ප්‍රශ්නය විමසා තිබුණි. බහුතරයක් අයදුම්කරුවන් නිවැරදි පිළිතුර සපයා නියමිත ලකුණු ලබාගෙන තිබුණි. සමහර අයදුම්කරුවන් වැරදි පිළිතුරු ද සපයා තිබුණි.

ආර්ථික විද්‍යාවේ ‘‘තේරීම” යන්නෙහි අදහස විමසා තිබුණි.

(1) තේරීම පිළිබඳ ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු සපයා ලකුණු ලබාගත් අයදුම්කරුවන් බොහෝ වේ.

(2) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක උපකල්පන යන්නට නිවැරදි පිළිතුර සපයා තිබූ අයදුම්කරුවන් මෙන්ම ප්‍රශ්නය නිවැරදිව තේරුම් නොගෙන වැරදි පිළිතුරු සැපයූ අයදුම්කරුවන්ද සිටියහ.

**(1.2)** ආර්ථික විද්‍යාවේ හිඟකම සම්බන්ධව අසා තිබූ ප්‍රශ්නයට නිවැරදි පිළිතුර ලෙස ‘‘එය මිනිස් අවශ්‍යතා සහ උවමනා සපුරා ලීම සඳහා ඇති සම්පත් වල සීමිත බව වේ.” යනුවෙන් බහුතරයක් තෝරාගෙන තිබුණි.

**(1.3)** යම් තීරණයක් තෝරා ගැනීමේදී කැප කරනු ලබන ඊළග හොඳම විකල්පයේ වටිනාකම ආවස්ථික පිරිවැය ලෙස නිවැරදිව ලියා බොහෝ අයදුම්කරුවන් ලකුණු ලබාගෙන ඇත.

**(1.4)** උපයෝගීතා සංකල්පය පදනම්කරගෙන මෙම ප්‍රශ්නය අසා තිබූ අතර බොහෝ අයදුම්කරුවන් අවබෝධයකින් තොරව නිවැරදි පිළිතුර ලෙස ''භාණ්ඩ හා සේවා පරිභෝජනය කිරීමෙන් ලැබෙන ආන්තික තෘප්තිය මුළු උපයෝගීතාවය වේ." යන වරණය තෝරා ලකුණු ලබා නොගත් බව පෙනේ. සමහරක් අයදුම්කරුවන්ට පමණක් මේ පිළිබඳව අවබෝධය නිවැදිව තිබුණි.

**(1.5)** ඉල්ලුම් නම්‍යතා සංකල්පය යටතේ අසා තිබූ මෙම ප්‍රශ්නයට අයදුම්කරුවන් නිවැරදි පිළිතුරු සපයා ලකුණු ලබාගෙන තිබුණි.

**(1.6)** පාරිභෝගික අතිරික්තය හා නිෂ්පාදන අතිරික්තය පිළිබඳ අවබෝධය පරීක්ෂා කිරීමට දී ඇති මෙම ප්‍රශ්නයට බොහෝ අයම්කරුවන් නිවැරදි පිළිතුරු සපයා තිබුණත් සමහර අයදුම්කරුවන්ට මෙම සංකල්පය පිළිබඳ අවබෝධය ප්‍රමාණවත් නොවීමත් ප්‍රස්ථාරිකව ගණනය කිරීම පිළිබඳ අනවබෝධය නිසාත් වැරදි පිළිතුරු සපයා තිබුණි.

**(1.7)** විද්‍යුත් මුදල් පිළිබඳ දැනුම පරීක්ෂා කිරීමට දී ඇති ප්‍රශ්නයට බොහෝ අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු සපයා තිබුණි.

**(1.8)** ඉල්ලුම් න්‍යාය පිළිබඳ අවබෝධය පරීක්ෂා කිරීමට දී ඇති මෙම ප්‍රශ්නයට බොහෝ අයදුම්කරුවන් සාර්ථකව පිළිතුරු සපයා නොතිබුණි. සමහර අයදුම්කරුවන් "වෙළඳපොළක භාණ්ඩ මිල හා එම භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණය අතර ඇති ප්‍රතිලෝම සම්බන්ධය වේ." ලෙස නිවැරදි පිළිතුර සපයා ලකුණු ලබා ගෙන තිබුණි.

**(1.9)** ගෙවුම් ශේෂ ලේඛණය පිළිබඳ දැනුම් පරීක්ෂා කිරීමට දී ඇති මෙම ප්‍රශ්නයට වැඩි පිරිසක් රාජ්‍ය ප්‍රධාන ලෙස සඳහන් කර ලකුණු ලබා නොගත් අතර ඍජු විදේශ ආයෝජන ලෙස ලියා ලකුණු ලබාගත් පිරිස ඉතා අවම මට්ටමක පැවතුණි.

**(1.10)** මෙය අයදුම්කරුවන්ගේ ප්‍රායෝගික දැනුම පරීක්ෂා කිරීමට දී තිබූ ප්‍රශ්නයකි. මහ බැංකු වාර්තාව වැනි ලේඛණ පරීක්ෂා කර නොතිබූ බව වැරදි පිළිතුරු ලිවීමෙන් තහවුරු වේ. පරිපූර්ණ දැනුමක් තිබූ අයදුම්කරුවන් 2.3% යන පිළිතුර සපයා ලකුණු ලබාගෙන තිබූ බව පෙනේ.

**(1.11)** නිවැරදි පිළිතුර තේරීමේදී ආන්තික පිරිවැය පිළිබද අවබෝධය පරීක්ෂා කිරීමට දුන් මෙම ප්‍රශ්නයට බොහෝමයක් අයදුම්කරුවන් නිවැරදි පිළිතුර ආන්තික පිරිවැය යන්න සපයා ලකුණු ලබා ගැනීමට සමත් වී ඇත.

**(1.12)** ''පාරිභෝගික ආදායම වැඩිවන විට ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වේ." ලෙස නිවැරදි පිළිතුර සපයා ලකුණු ලබා ගත් පිරිස බොහෝ වේ.

**(1.13) - (1.15)**

දෙන ලද ප්‍රකාශයන් හි සත්‍ය අසත්‍ය බව සටහන් කිරීමට දෙන ලද මෙම ප්‍රශ්න 3 සඳහා පිළිතුරු සැපයීම සාර්ථක මට්ටමක පැවතීය. බොහෝ අයදුම්කරුවන් වැරදි පිළිතුර සපයා තිබුණේ **1.14** වැන්නට ය. මෙම ප්‍රකාශය සත්‍ය වුවත් අසත්‍ය යන පිළිතුර සපයා ලකුණු ලබා නොගත් අය බොහෝ වේ. එමෙන්ම **1.15** දෙන ලද ප්‍රකාශය අසත්‍ය වුවත් ඒ සඳහා නිවැරදි පිළිතුරු බොහෝ අයදුම්කරුවන් විසින් සපයා නොතිබුණි. ඉල්ලුම් නම්‍යතාවය පිළිබඳ අවබෝධය බොහෝ දුරට අඩු බව පෙනේ.

**(1.16)** සැපයුම් වක්‍රය විතැන්වීම පිළිබඳව අවබෝධය පරීක්ෂා කිරීමට දුන් මෙම ප්‍රශ්නයට වැරදි පිළිතුරු බොහෝමයක් අයදුම්කරුවන් සැපයීමෙන් මෙම සංකල්පය පිළිබඳ අවබෝධය අඩු බව දක්නට ලැබුණි.සපයන භාණ්ඩයට ඇති ඉල්ලුම අඩු වීම අමුද්‍රව්‍ය නොමැතිවීම වැනි පිළිතුරු සපයා ලකුණු ලබා නොගත් අයද බොහෝ වේ.

**(1.17)** ඉල්ලුම් ප්‍රමාණය වෙනස් වීම යන පදය පැහැදිලි කිරීමේදී ආදායම වැඩි වීම, අඩු වීම අනුව එයට ඇති ඉල්ලුමේ වෙනස් වීම ලෙසත් මිල ස්ථාවරව තිබියදී අනෙකුත් සාධක වෙනස් වීම ලෙසත් සමහර අයදුම්කරුවන් වැරදි පිළිතුරු සපයා තිබුණි.

**(1.18)** පරිමාණානුකූල ඵල න්‍යාය පිළිබඳ අවබෝධය පරීක්ෂා කිරීමට දී ඇති මෙම ප්‍රශ්නයට බොහෝ අයදුම්කරුවන්ට ලකුණු ලබා ගැනීමට නොහැකි විය.

පිළිතුරු කිසිවක් නොලියූ අයදුම්කරුවන් බොහොමයක් වේ.

**(1.19)** ආන්තික ආදායම පිළිබඳ දැනුම පරීක්ෂා කිරීමට දී ඇති මෙම ගැටළුවට බොහෝ අයදුම්කරුවන් නිවැරදි පිළිතුරු සපයා නොතිබුණි.

**(1.20)** වෙළඳපොලට රජය මැදිහත් වන ආකාරය පිළිබඳ බොහෝ අයදුම්කරුවන් නිවැරදි පිළිතුර සැපයීමට අපොහොසත් විය. සමහර අයදුම්කරුවන් වෙළඳ පොළට රාජ්‍ය මැදහත් වන ආකාරය සම්බන්ධයෙන් ව්‍යාපාර තොරතුරු එක් රැස් කිරීම යනුවෙන් වැරදි පිළිතුරු සපයා ලකුණු ලබා ගැනීමට අපොහොසත් විය.

## <u>B කොටස</u>

එක් කොටසකට ලකුණු 10 බැගින් අනිවාර්ය ප්‍රශ්න 4 කි.

ප්‍රශ්න අංක **02**

**(a)** නිෂ්පාදන සාධක පිළිබඳ අවබෝධය හොඳින් ලබාගෙන ඇති බව පිළිතුර නිවැරදිව ලිවීමෙන් පෙනේ. සමහර අයදුම්කරුවන් කුටුම්භ අංශය-රාජ්‍ය අංශය-ව්‍යාපාර අංශය හා විදේශ වෙළඳ අංශය ලෙස වැරදියට ද පිළිතුරු සපයා ඇත.

**(b)** වෙළඳපොළ ආර්ථික ක්‍රමයක ලක්ෂණ පිළිබඳව විමසා තිබුණි. වෙළඳපොළ ආරක්ෂක ක්‍රමයක් ලෙස ඉල්ලුමට අනුව සැපයුම ලබාදීම,මිල සහ ඉල්ලුම අතර ප්‍රතිලෝම සම්බන්ධයක් තිබීම ලෙස ලියා ලකුණු ලබා නොගත් අයදුම්කරුවන් සිටින ලදී. එසේවුවද බොහොමයක් අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු සපයා ලකුණු ලබාගෙන තිබුණි.

## ප්‍රශ්න අංක 03

**(a)** නිෂ්පාදිතයට අදාල ඉල්ලුම් සමීකරණය හා සැපයුම් සමීකරණය ඉදිරිපත් කිරීමෙන් සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කිරීම මගින් ඉල්ලුම් සැපයුම් න්‍යාය පිළිබඳ අවබෝධය පරීක්ෂා කිරීමට දී ඇති මෙම ගැටළුව නිවැරදිව විසඳූ අයදුම්කරුවන් බොහෝ වෙතත් වැරදි ලෙස විසඳූ අයදුම්කරුවන් බොහෝ වේ. එමෙන්ම කිසිම ලකුණක් ලබා නොගත් අයදුම්කරුවන් ද සිටින ලදී.

**(b)** නිෂ්පාදන ක්‍රියාවලියේ දිගු කාලය සහ කෙටි කාලය අතර වෙනස විමසන ලදී. කෙටි කාලය හා දිගු කාලය යන්න ගැන නිවැරදි අවබෝධයක් නොමැති සිසුන් බොහෝ වේ. කෙටිකාලය යනු යම් භාණ්ඩයකට පවත්නා තාක්ෂණය යටතේ උපරිම කාර්යක්ෂමතාවයෙන් නිෂ්පාදනය කිරීමට ගතවන කාලය අඩුවීම ලෙසත් දිගු කාලයට ගතවන කාලය වැඩි නිසා කාර්යක්ෂමතාවය අවම වේ යැයි සමහර සිසුන් වැරදි ලෙස ලියා ලකුණු නොලබා ඇත. විචල්‍ය සාධක හා ස්ථාවර සාධක පිළිබඳව ඉතාම අඩු අවබෝධයක් ඇති බව පෙනේ.

**(c)** ඒකාධිකාරී තරඟ වෙළඳපොළක ලක්ෂණ ලෙස ඒකාධිකාරී වෙළඳපොලක ලක්ෂණ ලියූ අයදුම්කරුවන් බොහෝ වේ. එහෙත් සමහර අයදුම්කරුවන් දක්ෂ ලෙස පිළිතුරු සපයා මුළු ලකුණු ප්‍රමාණය ලබාගෙන තිබුණි.

## ප්‍රශ්න අංක 04

**(a)** වාණිජ බැංකුවක කාර්යයන් පිළිබඳව අසන ලද මෙම ප්‍රශ්නයෙන් වාණිජ බැංකුවක් පිළිබඳ අවබෝධය පරීක්ෂා කරන ලදී. සමහර සිසුන් අවබෝධයකින් තොරව වැරදි සහගත පිළිතුරු සපයා තිබූ අතර නියමිත අදාල නිවැරදි පිළිතුර ලියූ අයදුම්කරුවන් ද සැලකිය යුතු පිරිසක් සිටින ලදී.

**(b)** මෙම ප්‍රශ්නයෙන් බැංකුවලට අදාලව ලාභදායීත්වය සහ ද්‍රවශීලතාවය අතර සම්බන්ධතාවය පැහැදිලි කිරීමට අවශ්‍ය විය. ලාභදායීත්වය හා ද්‍රවශීලත්වය පිළිබඳව අයදුම්කරුවන් වැඩි සංඛ්‍යාවකට ලකුණු ලබා ගැනීමට අපොහොසත් විය. ඔවුන්ට ඒ පිළිබඳ අවබෝධයක් නොමැති බව කිව යුතුය. සමහර අයදුම්කරුවන් පිළිතුරු ලියා තිබුණේ නැත.

**(c)** උද්ධමනය ඇති වීමට හේතු දැක්විය යුතු විය. උද්ධමනය ඇතිවීමට හේතු සම්බන්ධව බොහෝ අයදුම්කරුවන් වැරදි පිළිතුරු ලියූ ප්‍රශ්නයකි. ඔවුන්ට ඒ පිළිබඳව නිවැරදි අවබෝධයක් නොමැති වීම නිසා ලකුණු ලබා ගැනිමට නොහැකි විය. ඇතැම් අයදුම්කරුවන් පිළිතුරු සැපයීමට ඉදිරිපත් නොවීය.

ප්‍රශ්න අංක **05**

**(a)** මෙම ප්‍රශ්නය මගින් අන්තර් ජාතික වෙළඳාමේ අවාසි පිළිබඳව විමසා තිබුණි.අන්තර්ජාතික වෙළඳාම පිළිබඳ අවබෝධය පරීක්ෂා කිරීමට දී ඇති මෙම ප්‍රශ්නයට නියමිත ලකුණු ලබා ගැනීමට නොහැකි වූ අයදුම්කරුවන් සැලකිය යුතු පිරිසක් සිටින ලදී. සමහර අයදුම්කරුවන් පිළිතුරු සපයා නොතිබුණි. නිවැරදි පිළිතුරු සපයා මුළු ලකුණු ලබා ගත් අයදුම්කරුවන් යම් පිරිසක් සිටින ලදී.

**(b)** ආරක්ෂණවාදයේ වාසි පිළිබඳව අසා තිබූ මෙම ප්‍රශ්නයට බොහෝ අයදුම්කරුවන් නිවැරදි පිළිතුරු ලියා තිබුණද,සමහර අයදුම්කරුවන් මෙම කොටසට පිළිතුරු කිසිවක් ලියා නොතිබුණි.

**(c)** ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීමෙන් ශ්‍රී ලංකා ආර්ථිකයට ඇතිවන ප්‍රතිවිපාක පිළිබඳව අසා ඇති මෙම ප්‍රශ්නයට මුළු ලකුණු ලබා ගැනීමට හැකි වූයේ අයදුම්කරුවන්ගෙන් ඉතාමත් අඩු ප්‍රමාණයකටය. සපයා ඇති පිළිතුරු නිවැරදි ඒවා නොවීම නිසා බහුතරයකට ලකුණු ලබා ගැනීමට නොහැකි විය. ඉතාමත් කාලෝචිත මෙන්ම විෂයානුබද්ධ ප්‍රශ්නයක් වූ මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගේ කාර්යසාධනය ඉතාමත් අවම මට්ටමක පැවතුණි.

## C කොටස

ප්‍රශ්න අංක **06**

**(A) (a)** වෙළඳපොළ මිලට දළ දේශීය වියදම ගණනය කළ යුතු විය. වෙළඳපොළ දළ දේශිය වියදම සෙවීමට සමහර අයදුම්කරුවන් පෞද්ගලික පරිභෝජන වියදම රජයේ පරිභෝජන වියදම හා දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය යන කොටස් තුන පමණක් ගලපා නිවැරදි නොවූ පිළිතුරු සපයා ඇති අතර තොග වෙනස්වීම යන්න ගැලපිය යුතු වුවද එය ගලපා නැත.

**(b)** වෙළඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය ගණනය කළයුතු විය. වෙළඳපොළ මිලට දළ දේශිය නිශ්පාදිතය සෙවීමේදී ශුද්ධ අපනයන එනම් අපනයන හා ආනයන අතර වෙනස ගලපා නොමැත. සමහර සිසුන් අපනයන පමණක් ගලපා ඇත.

**(c)** වෙළඳපොළ මිලට දළ ජාතික ආදායම ගණනය කළ යුතු විය. දළ ජාතික ආදායම සෙවීමේදී විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායමෙහි සෘණ අගය ගැන නොසලකා එම අගය එකතු කර තිබීමෙන් ලබා ගත යුතු ලකුණු ලබාගත නොහැකි වී ඇත. රජයේ පිස්කල් සහ මූල්‍ය ප්‍රතිපත්තිය අතර වෙනස පැහැදිලි කළ යුතුය.

**(B) (a)** රජයේ පිස්කල් ප්‍රතිපත්තිය යනු රජය විසින් නිර්මාණය කරගත් පොදු සංකල්ප ලෙස ලියා ඇත. මූල්‍ය ප්‍රතිපත්තිය මූල්‍යමය සංකල්පයට අනුව නිර්මාණය වී ඇති බව වැරදි ලෙස ලියා ඇත. මේ ප්‍රශ්නය සඳහා කාර්යසාධනය සාර්ථක මට්ටමක නොපැවතුණි.

**(b)** අයවැය හිගය යන්නෙහි අදහස විමසා තිබුණි. අයවැය හිගය පිළිබඳව සාර්ථකව පිළිතුරු ලියා නැත. ඒ පිළිබඳ නිවැරදි අවබෝධයක් නොතිබූ බව දක්නට ලැබුණි.

**(c)** වෙළඳපොළ ආර්ථිකයක් තුළ සම්පත් බෙදීයාමේ අකාර්යක්ෂමතාවයන් වැලැක්වීමට රජය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග සඳහන් කළ යුතු විය. සම්පත්වලට නිල අගයක් එක් කිරීම, විවිධ බදු නීති පැනවීම වැනි නිවැරදි නොවන කරුණු ඉදිරිපත් කර ලකුණු ලබා නොගෙන ඇත. මෙම ප්‍රශ්නය නිවැරදිව අවබෝධ කරගෙන නොමැත.

\- - -

<u>විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනිමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:</u>

(1) විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා විෂය කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම.

(2) ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා ප්‍රශ්නයෙන් අසා ඇති උත්තර පිළිබඳව නිශ්චිත ඍජු උත්තර සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම්/විස්තර ලිවීම් නොකළ යුතුය.

(3) කළ යුතු ක්‍රියා පරික්ෂා ලැයිස්තුව ප්‍රශ්න පත්‍රයටම අමුණා ඇත. වාස්තවික ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළයුතු ක්‍රියාවකින් යුක්ත වේ. එහි දී ඇති අර්ථකථනවලට අනුකූලවෙමින් උත්තර ලියන්න.

(4) මෙම විෂයට අදාළ ස්ව-අධ්‍යයන පාඩම් මාලාව, ග්‍රන්ථ, අත්පොත් ලිපි, සඟරා, මහ බැංකු වාර්තා ආදිය මැනවින් පරිශීලනය කිරීම.

(5) උත්තර ලිවීමේදී මූලික න්‍යායාත්මක සංකල්ප නිවැරදිව හඳුනාගැනීමට හා සංසන්දනාත්මකව විමසීමට අවශ්‍ය කුසලතා ගොඩ නැගීම.

(6) අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.

(7) ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

(8) පසුගිය විභාග ප්‍රශ්න හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.

(9) ආර්ථික විද්‍යා සංකල්ප පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනිම තුළින් එකිනෙක සංකල්ප අතර ඇති වෙනස සංසන්දනාත්මකව ගොනු කිරීමේ හැකියාව තිබිය යුතුය.

(10) කාලය මනාව කළමනාකරණය කර ගැනීම.

(11) උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසි පරිදි යොදා තිබේදැයි නැවත පරික්ෂා කර බැලීම.

(12) පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත්වීම.

\- * * * -